| | |
|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112698507 , 0112694033<br>) 0112675449 , 0112675280 |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>)0112692913 |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) |

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதாரம் அமைச்சு
**Ministry of Health**

| | |
|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | )<br>)<br>) CF/EXA/03/2021 |
| ඔබේ අංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| දිනය<br>திகதி<br>Date | )<br>) 2021/ 07/ 14<br>) |


පොදු චක්‍රලේඛ ලිපි අංක - 01-26/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවා ගණයේ (MT-06-2016) අක්ෂි තාක්ෂණවේදි තනතුරෙහි II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2021**

අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදි තනතුරෙහි II "ආ" ඛණ්ඩයේ III ශ්‍රේණියේ නිලධාරීන්, III ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ගතවීමට පෙර සමත් විය යුතු පළමු වන **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02 **සුදුසුකම් :-**
මෙම විභාගයට අයදුම් කල යුත්තේ අක්ෂි තාක්ෂණවේදි II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීමක් ලබා මෙතෙක් විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පමණි.

03 **අයදුම්පත් :-**
මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, අංක 385, සුවසිරිපාය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2021.08.16** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ ලිපිනය ලියන ලද (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) රු **45.00** ක් වටිනා මුද්දර ඇලවූ "9×4" ප්‍රමාණයේ ලියුම් කවර 2ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත්, දෙවන පිටුවේ අංක 05-09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 04. විභාග ගාස්තු

1. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

2. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

## 05. විභාගයට ඇතුලත් කර ගැනීම

1. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට / අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

2. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

   (අ) ජාතික හැඳුනුම්පත
   (ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරනු ලබන හැඳුනුම්පත
   (ඇ) වලංගු රියදුරු බලපත්‍රය
   (ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 06 විභාග පරිපාටිය

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති යනුවෙන් හා මුදල් රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා කාලය පැය 03 කි. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කරන අතර සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයන් අයදුම් කළ යුතුය.

## 07 විෂය නිර්දේශ මාලාව

### 7.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ. කාලය පැය 03 යි. රචනා මාදිලියේ ප්‍රශ්න 08 කින් සමන්විත වන අතර එයින් ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

#### 7.1.1 ආයතන සංග්‍රහයේ පරිච්ඡේද

- ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ :-

  IV පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලික තත්වය, ස්ථිර තත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම

- ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද :

  XII පරිච්ඡේදය - නිවාඩු
  XIII පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර
  XIV පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්
  XIX පරිච්ඡේදය - රජයේ නිවාස
  XLVII පරිච්ඡේදය - සමාන්‍ය හැසිරීම හා විනය
  XLVIII පරිච්ඡේදය - විනය කාර්ය පටිපාටික පිළිබඳ රීති

7.2 **මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 03 යි. රචනා මාදිලියේ ප්‍රශ්න 08 කින් සමන්විත වන අතර එයින් ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මු.රෙ 01 සිට මු.රෙ 68 දක්වා)

III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ 124 සිට මු.රෙ 147 දක්වා)

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා ගෙන උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියලුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

**සැ.යු - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන් අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXA

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය ගණයේ (MT-06-2016) අක්ෂි තාක්ෂණවේදීතනතුරෙහි II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

01. (අ) I අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ..........................................

..........................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්,)

III මුලකුරු සමඟ නම (සිංහලෙන්) ..........................................

..........................................

IV මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) I. මුල් පත්වීම් දිනය ..........................................

II. දැනට ලබන වාර්ෂික වැටුප ..........................................

III. ජංගම දුරකථන අංකය

IV ජාතික හැඳුනුම්පත් අංකය

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ☐ මුදල් රෙගුලාසි ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය ..........................................

(ආ) එම ආයතනය අයත්වන්නේ - මධ්‍යම රජයට - ☐

- පළාත් සභාවට - ☐

(ඇ) පළාත් සභාවේනම් අදාල පළාත ..........................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය ..........................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"X4" ප්‍රමාණයේ රු. 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02 ක් අයදුම්පතට අමුණන ලද්දේද? ..........................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්) ..........................................

..........................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..........................................

..........................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ ..........................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ......................................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?..............................................

| මුද්දර කොටුව |
|---|

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රු. ...............ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත්, ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය ....................................  ......................................
අයදුම්කරුගේ අත්සන

**පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිළධාරියාගේ / නිලධාරිනියගේ සහතිකය**

07. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාර දුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනු කළ බවත් සහතික කරමි.

දිනය ....................................  ........................................
නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

................................මහතා/ මහත්මිය / මෙනවිය .................................... නිළධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, රු........ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීම අනවශ්‍ය බවද අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්,මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

**දිනය** ........................  ....................................
**ආයතන ප්‍රධානියාගේ අත්සන**
**[රබර් මුද්‍රාව තැබිය යුතුය]**

09. **විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..............................................................................................මහතා/ මිය/ මෙනෙවිය අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II "ආ" බන්ධයේ/ III ශ්‍රේණියේ නිළධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

........................................
දිනය ....................................  විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(අනවශ්‍ය කොටස් කපා හරින්න)  (මුද්‍රාව තැබිය යුතුය)